**ශීර්ෂය 259- මාතලේදිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වයප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මාතලේදිස්ත්‍රික් ලේකම් කර්යාලයේමූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 25 වන දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූනි 23 දිනගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021දෙසැම්බර් 31 දිනට මාතලේදිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම,විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්,වියදම්,වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන,වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්,ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර,එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්,ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳවගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

-------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

----------------------------------------

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

------------------------

**(අ) විගණන සාක්ෂි නොවීම**

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (i) | අක් මුදල් ගැලපුම් ප්‍රකාශයේ දැක්වෙන දුම්රිය දෙපාර්තමේන්තුව විසින් මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වැය ශීර්ෂයට හර කරන ලද රු.25,100 ක වටිනාකම සඳහා හර නිවේදන විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | දුම්රිය දෙපාර්තමේන්තුව වෙත දැනුම් දුන්න ද හර නිවේදන නියමිත කාලය තුළ ලබා නොදීම දිගින් දිගටම සිදුවන බව දන්වා ඇත. | හර නිවේදන ලබාගෙන ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු ය. |
| (ii) | මූල්‍ය ප්‍රකාශනවල ACA-3 අග්‍රිම ගිණුම පිළිබඳ ප්‍රකාශයේ වෙනත් මූලාශ්‍ර ලැබීම්වලට අදාළව හිලව් කිරීම් ලෙස දක්වා තිබුණු රු.61,049,778ක් සඳහා ලැබීම් මූලාශ්‍ර විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | ගලේවෙල හා උකුවෙල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් දෛනිකව එකතු කරන ලද ආදායම් තනි තනි ලැබීම් වවුචර ලෙස සිගාස් වැඩසටහනට ඇතුළත් කිරීම වෙනුවට එක් අගයක් ලෙස ඇතුළත් කිරීම මත මෙමඅඩුපාඩුව සිදුව ඇති බව හා ඉදිරියේදී මේ ආකාරයට ගිණුම්ගත නොකරන ලෙස දැනුවත් කර ඇති බව දක්වා ඇත. | ලැබීම් මූලාශ්‍ර විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු ය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය<br>වටිනාකම<br>රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 104 | 49,875 | වාහන අනතුරකට අදාළ අලාභය සම්බන්ධයෙන් අනතුරු සිදුවී මාස 06 ක කාලයක් ගතවී තිබුණ ද මුදල් රෙගුලාසි අනුව කටයුතු කර නොතිබුණි. | රු.49,875 ක මුදල නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | මුදල් රෙගුලාසි 104අනුව කටයුතුකළ යුතු ය. |

## 2.2 වංචනික ස්වරූපයේ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වයඹ ඇළ ව්‍යාපෘතිය සඳහා ඉඩම් පවරාගැනීමේ දීගල්වෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දඹුයාය ග්‍රාම නිලධාරි වසමේ ඉඩම් කැබැල්ලක වටිනාකම පළාත් ප්‍රධාන තක්සේරුකරු විසින් පළමුව කුඹුරු ඉඩමක් ලෙස සළකා රු.91,000ක සංවර්ධන වටිනාකමක් වන්දි ලෙස තිරණය කර තිබුණද අවස්ථා කිහිපයකදී තක්සේරු වටිනාකම වෙනස් කිරීම මත අවසානයේදී රු.2,905,800ක් ගෙවා තිබීමේ පදනම විගණනයේ දී තහවුරු නොවුණි. | කුඹුරු ඉඩමක් ලෙස තක්සේරු කර තිබුණ ද වසමේ අනික් ඉඩම් හා සැසඳීමේ දී ගොඩ ඉඩමේ තක්සේරුව ලබා දී ඇත. | විධිමත් පරීක්ෂණයක් කර වැඩිපුර ගෙවීමක් සිදුවී ඇත්නම් එය වගකිව යුතු පාර්ශවයෙන් අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ආ)** | වයඹ ඇළ ව්‍යාපෘතිය සඳහා ඉඩම් පවරාගැනීමේ දීගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රජයේ ඉඩම් කැබලි 07 ක් සඳහා විධිමත් අනුමැතියකින් තොරව පෞද්ගලික ඉඩම් ලෙස සලකා රු.2,791,975ක වන්දි මුදල් ගෙවා තිබුණි. | වයඹ ඇළ ව්‍යාපෘතිය සඳහා කළුගඟ ව්‍යාපෘතිය ඉදිකිරීමේ දී කටයුතු කළ ආකාරයට කටයුතු කරන ලෙස දන්වා තිබූ අතර නැවත විශේෂ අනුමැතියකින් තොරව වන්දි ගෙවීම සිදු කර ඇති බව දක්වා ඇත. | - එම - |

**2.3 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම**

-----------------------------------------

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කරමින් සිටිය දී වසර 05 කට අධික කාලයකට පෙර වැඩ තහනමට ලක් වූ සේවයකයකුගේ රු.170,602 ක ආපදා ණය අයකර නොතිබුණි. | රු.1,000 බැගින් වාරික අය කරමින් පවතින බව දන්වා ඇත. | ණය මුදල්අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

------------------------------------------------

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ගොඩනැගිලි ව්‍යාපෘති 06 ක් හා ක්‍රීඩාපිටියක් ඉදිකිරීමසඳහා රු.5,975,482 ක් වැය කර තිබුණ ද, තවදුරටත් නිමකළ යුතු වැඩකොටස් පැවතීම හේතුවෙන් එම ඉදිකිරීම් ව්‍යාපෘති භාවිතයට යොදා ගැනීමට නොහැකි වී තිබුණි. ඒ හේතුවෙන් ඒ සඳහා වැය කළ මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | ඉදිකිරීම්වල ප්‍රමිතය හා තත්ත්වය අපේක්ෂිත මට්ටමේ නොපැවතීම හේතුවෙන් ගෙවීම් අත්හිටුවා ඇති බව දන්වා ඇත. | ව්‍යාපෘතිවල වැඩ කොටස් සම්පූර්ණ කර උපයෝජනය කළ යුතු ය. |

## 3.2 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය යටතේ ධාන්‍ය හා කුරුඳු නිෂ්පාදන කටයුතු වැඩිදියුණු කිරීම සඳහා රු. 682,500 ක වියදමක් දරා ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි. එහෙත් එම ගොඩනැගිල්ලේ දැල් ආවරණ දමා නොතිබීම හා යකඩ ගේට්ටු නියමිත උසට දමා නොතිබීම නිසා අනාරක්ෂිත බව හේතුවෙන් යන්ත්‍ර ස්ථාපිත කර නොතිබූ අතර ගොඩනැගිල්ලේ වී හා ධාන්‍ය ඇඹරීමේ යන්ත්‍ර ස්ථාපිත කිරීමට ප්‍රමාණවත් ඉඩකඩ ද නොතිබුණි. | අදියර කිහිපයක් යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘතියක් බැවින්, ඊළඟ අදියරේ දී ප්‍රමාණවත් පරිදි ගොඩනැගිලි ඉදි කරන බව දන්වා ඇත. | ගොඩනැගිලි ඉදිකිරීමට පෙර විධිමත්ව සැලසුම් කළ යුතු අතර ඒවා නිසි පරිදි නිමකර උපයෝජනය කළ යුතුය. |

## 3.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මොරගොල්ල ග්‍රාම නිලධාරි වසමේ දෙමහල් ස්වයං රැකියා මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාළ ගිවිසුම අනුව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 30 දින වන විට වැඩ අවසන් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් 22 වන විට ද වැඩ අවසන් කර නොතිබුණි. | අයහපත් කාලගුණය හේතුවෙන් ව්‍යාපෘතිය නියමිත දිනට ආරම්භ කිරීමට නොහැකි වූ අතර ඉතිරි වැඩ කොටස් සඳහා 2021 ප්‍රතිපාදන නොලැබුණු බව දන්වා ඇත. | ගොඩනැගිල්ලේ වැඩ නිම කර උපයෝජනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය යටතේ පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන වැඩි දියුණු කිරීම සඳහා රු. 282,500 ක වියදමින් ඉදිකළ ගොඩනැගිල්ලේ වැඩ කටයුතු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අවසන් කළ යුතු වුව ද 2022 පෙබරවාරි 08 වනවිට ද අවසන් කර නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය අදියර කිහිපයක් යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘතියක් බැවින් ඊළඟ අදියරේ දී ප්‍රමාණවත් පරිදි ගොඩනැගිලි ඉදිකිරීම සඳහා කටයුතු කරන බව දන්වා ඇත. | - එම - |
| (ඇ) | ධාන්‍ය හා කුරුළු නිෂ්පාදනකරුවන් දිරිගැන්වීමේ ව්‍යාපෘතියට අදාළව යටිතල පහසුකම් සංවර්ධනය යටතේ පල්ලේපොල අම්බොක්ක තිඹිරියංග මාර්ගයේ අඩි 1040 ක් කැට ගල් අතුරා සංවර්ධනය කරසමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩ අවසන් කිරීම සඳහා රු.මිලියන 3 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. එහෙත් 2022 පෙබරවාරි 08 දින වන විට ද වැඩ අවසන් කර නොතිබුණි. | ඉදිකිරීම් ද්‍රව්‍ය හිඟකම හේතුවෙන් මාර්ගයේ වැඩ කටයුතු අවසන් කිරීමට ප්‍රමාද වූ අතර , මෙය සියලු ව්‍යාපෘති සඳහා පොදු තත්ත්වයක් වූ බව දන්වා ඇත. | ව්‍යාපෘතිවල වැඩ අවසන් කර උපයෝජනය කළ යුතුය. |

## 3.4 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ------------------------- | -------------- |
| (අ) | උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තල හා මුරුක්කු නිෂ්පාදකයින්ගේ නිෂ්පාදනය ඉහළ නැංවීමට අවශ්‍ය වැඩ කුටි ඉදිකිරීම සඳහා රජයේ දායකත්වය යටතේ රු.100,000 බැගින් රු. 900,000 ක ඉදිකිරීම් ද්‍රව්‍ය ප්‍රතිලාභීන් 09 දෙනෙකුට ලබාදී | කොවිඩ් 19 වසංගතය තුළ ආදායම් උත්පාදන මාර්ග සීමාවීම, ඉදිකිරීම ද්‍රව්‍ය හිඟ කම හා මිල ගණන් ඉහළ යාම මත වැඩ කුටි ඉදිකිරීම ප්‍රමාද වූ අතර වර්තමානය වන විට එම වැඩ කුටි කඩිනමින් ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු යොදා ඇති බව දන්වා ඇත. | අදාළ ඉදිකිරීම් ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබුණි. එහෙත් 2022 ජනවාරි 26 දින වන විටද වැඩ කුටි ඉදිකිරීම ආරම්භ කර නොතිබුණි. | | |
| **(ආ)** | සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය යටතේ උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංග සම්පූර්ණ ලාක්ෂා පුහුණු ගම්මානයක් නිර්මාණය කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ රු.800,000 ක ඉදිකිරීම් ද්‍රව්‍ය ප්‍රතිලාභීන් 8 දෙනෙකුට ලබාදී තිබුණි. එහෙත් අදාළ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. | - එම - | - එම - |
| **(ඇ)** | සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතියට අදාළව උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කාබනික පෙහොර නිෂ්පාදකයින් සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය යටතේ කාබනික පොහොර නිෂ්පාදනය සඳහා රු.1,000,000 ක ඉදිකිරීම් ද්‍රව්‍ය ප්‍රතිලාභීන් 10 දෙනෙකුට ලබාදී තිබුණි. එහෙත් 2022 ජනවාරි 26 දින වන විටද අදාළ ඉදිකිරීම් අවසන් කර කාබනික පොහොර නිෂ්පාදනය කිරීම ආරම්භ කර නොතිබුණි. | කාබනික පොහොර නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍ය යොදා කොම්පෝස්ට් බවට පත් වන තෙක් එකම ස්ථානයක ගොඩ ගසා තබා පසුව කුටි තුළ ගබඩා කරනු ලබන බැවින් ගබඩා තුළ පොහොර නොතිබුණු බව දන්වා ඇත | ඉදිකිරීම් අවසන් කර අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.5 ප්‍රසම්පාදනයන්

-----------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ලිබඩු මිලදී ගැනීමට අදාළව අවශ්‍යතාවයට ගැලපෙන බව, භාණ්ඩයේ ප්‍රමිතිය, නිමාව, | තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් භාණ්ඩ පෞද්ගලිකව පරික්ෂා කර නොගැලපීම් අවම වන පරිදි මිලදී ගැනීම සිදු කර | මිල කැඳවීමේදී අවශ්‍ය පිරිවිතර දැක්විය යුතු අතර ඇගයීම් කටයුතු වලදී එම පිරිවිතර මත ඇගයීම් කළ |

| | | |
|---|---|---|
| කල්පැවැත්ම හා දැනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අවශ්‍යතාවයට ගැලපීම යන පිරිවිතර මත අදාළ අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ ආයතනවලින් භාණ්ඩ මිලදී නොගෙන වැඩි මිලකට මිලදී ගෙන තිබුණ ද එම පිරිවිතර මිල කැඳවීමේ ලිපියේ දක්වා නොතිබුණි. මේ හේතුවෙන් රු.556,399ක අලාභයක් සිදු වී තිබුණි. | ඇති බව දන්වා ඇත. | යුතුය. |

**3.6 කළමනාකරණ දුර්වලතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ගොඩනැගිලිවල පදිංචි වෙනත් ආයතන 11 කින් සමාලෝචිත වර්ෂයේජූනි සිට දෙසැම්බර් දක්වා මාස 07 ක කාලයට අදාළව අයවිය යුතු රු.888,818 ක් හිඟ කුලිය අයකරගෙන නොතිබුණි. | හිඟ මුදල ගෙවන ලෙස දන්වා ලිපි යවා ඇති බව දන්වා ඇත. | හිඟ ආදායම් අයකරගැනීමට කටයුතු කළ යුතු අතර හිඟ හිටීම වැලැක්වීම සඳහා ක්‍රමවේදයක් සැකසිය යුතුය. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉදිරිපත් කර තිබුණු කාර්යසාධන වාර්තාව අනුව හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන ඉලක්කවලින් පරිසර නිතිරීතිවලට අනුකුලව කටයුතු කිරීම, ඉඩම් රාජකාරී කටයුතු අධීක්ෂණය, ළමා ගැටළු සාකාච්ජා කර අවශ්‍ය පියවර ගැනීම හා අපයෝජනවලින් ආරක්ෂා කිරීම යන ඉලක්ක ලගා කර ගැනීමේ ප්‍රගතිය වාර්ෂික ඉලක්කයෙන් සියයට 50 ට අඩු මට්ටමක පැවතුණි. | මේ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකර ඉදිරියේ දී ප්‍රගතිය සියයට 50 ඉක්මවා යැමට නිලධාරීන් වෙත උපදෙස් ලබාදී ඇති බව දන්වා ඇත. | අපේක්ෂිත ඉලක්ක ළඟාකර ගැනීමට ක්‍රමවේදයක් සැකසිය යුතු ය. |

**5. යහපාලනය**

**5.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් සිට නොවැම්බර් දක්වා වූ කාල පරාසය තුළ ඉඩම් කොමසාරිස් ජනරාල්ගෙන් මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලැබී තිබුණු දීමනා පත්‍ර 20 ක් 2021 නොවැම්බර් 19 දින වන විට ද උරුමකරුට භාර නොදී මාස 01 සිට 07 දක්වා වූ කාලයක් රඳවාගෙන තිබුණි. | ඉඩම් කොමසාරිස් ජනරාල් හා පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව උත්සවයක් පවත්වා බෙදා දීමට කාර්යාලයේ රඳවා තබාගෙන ඇති බව දන්වා ඇත. | ප්‍රතිලාභීන් වෙත දීමනා පත්‍රලබාදීමට කටයුතු කළ යුතු ය. |
| **(ආ)** | දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරි වසම් 36 කින් ලැබී තිබුණු අයදුම්පත් 1333ක් සම්බන්ධයෙන් ඉඩම් කච්චේරි පවත්වා නොතිබුණු<br><br>අතර,දඹුල්ල නගරයේ හා මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරි වසම් 09 ට අදාළ ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු සිදු කර නොතිබුණි. | ඉදිරි දිනයන් තුළදී ක්ෂේත්‍ර පරීක්ෂණ අවසන් කරන ලෙස ජනපද නිලධාරි දැනුවත් කර ඇති බව දන්වා ඇත. | ඉඩම් කච්චේරි පැවැත්විය යුතු අතර අදාල ක්ෂේත්‍ර පරීක්ෂණ කළ යුතුය. |

**6.** **මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | -------------------------- | ------------- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල තනතුර 21 ක සේවක පුරප්පාඩු 212 ක් හා තනතුර 09 ක සේවක අතිරික්ත 133 ක් පැවතුණි. | 2022 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු අතර අතිරික්තය සම්බන්ධයෙන් අදාළ කටයුතු කළ යුතු ය. |
| (ආ) | ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ 2020 අගෝස්තු 31 දිනැති ඒකාබද්ධ සේවා නිලධරයන්ට අදාළ වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියේ 2.2.2 ඡේදය ප්‍රකාරව එකම ස්ථානයේ වර්ෂ 05 කට වැඩි කාලයක් සේවය කර ඇති නිලධාරීන් ස්ථාන මාරුවීමට යටත් විය යුතුය. එහෙත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා, ගලේවෙල, දඹුල්ල , උකුවෙල හා පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් 46 දෙනෙකු වර්ෂ 05ට වැඩි කාලයක් අඛණ්ඩව එකම ස්ථානයේ සේවයේ නියුක්තව පැවතුණි. | සංවර්ධන නිලධාරි ස්ථානමාරුවීම් ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම් උපදෙස් මත නතර කර ඇත. අනෙකුත් නිලධාරීන් ස්ථාන මාරු වීම් අයදුම් කළද ස්ථානමාරුවීම් ලැබී නොමැති බව හා 2022 වර්ෂයේදී අභ්‍යන්තර ස්ථාන මාරු පටිපාටිය මේ වන විට සකසා ඇති බව දන්වා ඇත. | එකම ස්ථානයේ වර්ෂ 05 කට වැඩි කාලයක් තිස්සේ සේවය කරන නිලධාරීන් ස්ථාන මාරු කළ යුතු අතර ස්ථාන මාරුවීම් ඉල්ලුම් කළ ද නොලැබෙන නිලධාරීන් දිස්ත්‍රික්කය ඇතුළත හෝ මාරුවීම් සිදුකළ යුතු ය. |